**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2017**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 ජූලි 26 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.9,470,084 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාලයට අයත් මල්වතු හිරිපිටිය පිහිටි ඉඩම රු.4,200,000 ක් සහ එම ඉඩම තුළ පිහිටි ගොඩනැගිල්ල රු.16,122,000 කට තක්සේරු කර තිබුණද ඒවා ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙක තුලදී වැඩිහිටි නිවාස තුනකට පරිත්‍යාග වශයෙන් මිලදී ගත් රු.369,928 ක් වටිනා ලීබඩු උපකරණ එම ආයතනවලට ලබාදී ඇතත් ආයතනයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර ඒ සඳහා රු.138,240 ක ක්ෂයවීම් ද ගැලපුම් කර තිබීම හේතුවෙන් වත්කම් සහ ක්ෂයවීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය කාර්යාලවලින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ සමාජ ආරක්ෂණ අරමුදල වෙත ලැබිය යුතු රු.18,814,700 ක් හා කොඩි විකිණීමෙන් එම කාර්යාල වෙතින් ලැබිය යුතු රු.335,792 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බෙදා නොහැර ඉතිරි වූ වැඩිහිටි සංවිධාන සඳහා අතුරු ව්‍යවස්ථාවේ ඉතිරි පිටපත් 25,466 ක පිරිවැය රු.763,980 ක් ලිපි ද්‍රව්‍ය තොගයට ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ ක්ෂය වටිනාකම රු 3,808,742 ක් වුවද එම අගය රු.4,114,295 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.305,553 කින් වැඩියෙන් දැක්වුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි. |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වැඩිහිටි දිනය වෙනුවෙන් උපහාර පිදීම සඳහා චෙක්පත් ලබාදීම | 2,625,000 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 48 ක් වෙත වැඩිහිටියන් 105 දෙනෙකු සඳහා ලබාදීමට යවන ලද චෙක්පත් ලද බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සනාථ කිරීම |
| (ආ) | වැඩිහිටි දීමනා ගෙවීම | 1,780,000 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් වෙත යවන ලද මුදල් ලබාගත් බවට දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සනාථ කිරීම |

### 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.3(අ) ඡේදය | සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කලයුතු නමුත් සභාව විසින් ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම දෙන ලද කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත් අවස්ථා 18 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.455,300 ක් වූ අත්තිකාරම් අදාල කාර්යය නිමවී දින 12 සිට දින 131 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාදවී පියවීම් සිදුකර තිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනයට අයත් සියළුම පරිගණක උපාංග සහ මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයක දැක්විය යුතු වුවත්, ලේකම් කාර්යාලයට අයත් රු.10,482,420 ක් වටිනා පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2015 මැයි 15 දිනැති අංක මු.අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 (අ) සහ 4(ඈ) ඡේද | විදේශ පුහුණු, සම්මන්ත්‍රණ, රැස්වීම් සහ වැඩමුළු සඳහා සහභාගීවීමේදී අනියම් දීමනාව වශයෙන් නිලධාරියෙක් සඳහා ලබාදිය හැකි වනුයේ දිනකට ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 40 ක් වුවද නිලධාරීන් 02 දෙනෙකු සඳහා දිනකට ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 75 ක් ලබා දී තිබුණි. ඒ අනුව රු.98,492 ක් වැඩියෙන් මුදල් ගෙවා තිබුනු අතර එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.591,468 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 816,530 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,407,998 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.11,964,482 කින් අඩුවුවද ආදායම රු.13,372,480 කින් අඩුවීම නිසා මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් පැවතියද 2016 වර්ෂයේ මූල්‍ය අතිරික්තයක් ඇතිවී 2017 වර්ෂයේදී නැවත ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.16,523,248 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනයවී 2017 වර්ෂයේ දී රු.46,105,933 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක කරා ළඟාවීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම සභාවේ පූර්ණ වගකීම වුවද සභාව විසින් සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැළැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණි. එමෙන්ම වර්ෂ කිහිපයක සිට එකම ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ අතර පනතේ කර්තව්‍යයන්ට සුදුසු ආකාරයට සකස් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

#### (අ) අක්ෂි කාච සහ ශ්‍රවණ උපකරණ ලබාදීම

සමාලෝචිත වර්ෂය සඳහා වැඩිහිටියන් වෙත වෛද්‍ය උපකරණ වශයෙන් අක්ෂිකාච 3,530 ක්, ශ්‍රවණ උපකරණ 400 ක් සහ වෛද්‍ය කඳවුරු 10 ක් පැවැත්වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.10,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අක්ෂිකාච මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ පුවත්පත් දැන්වීමක් පලකර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණේ ඔක්තෝබර් 31 දිනදීය. ඒ අනුව දෙසැම්බර් 15 දින ලංසු විවෘත කර එකක් රු.5,500 බැගින් රු.5,775,000 ක අක්ෂිකාච 1,050 ක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක අංක 31 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සති 04 කින් අවසන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන තෙක් අදාල මිළදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ii) සභාව විසින් ශ්‍රවණ උපකරණ 400 ක් මිළදී ගෙන බෙදාහැරීමට සැළසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධව කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

(iii) වෛද්‍ය කඳවුරු පැවැත්වීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 09 ක් විසින් ඉල්ලුම් කරන ලද රු.776,050 ක් ලබාදී තිබුණද දිස්ත්‍රික්ක වෙත ලබාදිය යුතු ප්‍රතිපාදනය කොපමණද යන්න පිළිබඳව සැළසුම්කර නොතිබුණි. එසේම මෙම වෛද්‍ය සායන සඳහා මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 02 තුලදී ලබාදී තිබූ අතර එම වෛද්‍ය සායන පැවැත්වූ බවට අදාල වියදම් විස්තර හෝ ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද එම වර්ෂය තුළදී වෛද්‍ය සායන පැවැත්වූයේ ද යන්න විගණනයට සනාථ නොවීය. මේ අනුව අදාළ වර්ෂයට කරන ලද සැළසුම් එම වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වී නොතිබීම නිසා සියයට 92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

#### (ආ) පුහුණු පර්යේෂණ සහ දැනුවත්කිරීම් වැඩසටහන්

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු සහ දැනුවත්කිරීමේ වැඩසටහන් 12 ක් සඳහා රු.8,575,000 ක් හා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 04 ක් සඳහා රු.4,000,000 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර එම වැඩසටහන් සඳහා පිළිවෙලින් රු.3,949,136 ක් සහ රු.3,824,052 ක් වැයකර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 04 යටතේ නායකත්ව පුහුණු වැඩ සටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කළද පවත්වා තිබුනේ එක් වැඩසටහනක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ පුහුණු හා ධාරිතා වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් එම වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.1,071,000ක මුදල් ඉදිරි වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පැවැත්වෙන වෘද්ධ විද්‍යාව ඩිප්ලෝමාව සඳහා යොදවා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදනයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඉදිරි වර්ෂය සඳහා යොදවා ගෙන තිබුණද, මෙම පාඨමාලාව සඳහා කාර්යාල නිළධාරින් 21 දෙනා සහභාගි කර නොතිබුණි.

**(ඇ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම**

---

වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම සභාවේ පනතේ කර්තව්‍යයන් වලින් එක් කාර්යයක් වූ අතර ඒ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු බව පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ වැඩිහිටි දිනය වූ ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අන්තර්ජාලය මඟින් ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක වැඩිහිටි නිවාස, වැඩිහිටි කමිටු, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි සංඛ්‍යාව ඇතුළත් කිරීමට සැළසුම් කර මෙම දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීමට වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ද දැනුවත් කර තිබුණි. කෙසේ වුවද, දත්ත පද්ධතිය යාවත්කාලීනවී නොතිබුණි.

**(ඈ) වැඩිහිටි දිනය පැවැත්වීම**

---

සමාලෝචිත වර්ෂයේ ජාත්‍යන්තර වැඩිහිටි දිනය ඔක්තෝබර් 01 දිනට යෙදී තිබුණු අතර එම දිනය සැමරීම සඳහා ක්‍රියාකාරී සැලස්ම යටතේ රු.16,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ඒ වෙනුවෙන් කර්තව්‍යයන් 08 ක් ඇතුළත්ව රු.18,758,000 ක ඇස්තමේන්තුවක් සකස්කර තිබූ අතර රු.15,966,800 ක් වියදම් දරා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 122 ක වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් 213 දෙනෙකුට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 65 ක වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිම දරුවන් සිටින වැඩිහිටි මාතාවන් 78 දෙනෙකුට රු.25,000 බැගින් රු.7,275,000 ක මුදල් ප්‍රදාන ලබාදීමට කටයුතු කර තිබුණි. එසේවුවද 2017 නොවැම්බර් 23 සහ 24 දෙදින දෙක තුළ රු.7,100,000 ක් වටිනාකමැති චෙක්පත් 184 ක් ලියා අත්සන් කර දින 45 ක පමණ කාලයක් ප්‍රමාදවී එනම් 2018 ජනවාරි 16 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සෘජුව තැපැල් කර තිබුණි.

(ii) 2018 පෙබරවාරි අවසාන සතිය වන විට මෙම මුදල් වැඩිහිටියන් වෙත ලැබී තිබුණද, මුදල් ලැබුණු බවට තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි.

(iii) වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් සඳහා උපහාර පිදීමත් වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිම දරුවන් සිටින මවුවරුන්ට උපහාර පිදීමත් යන කරුණු 02 මෙම වැඩිහිටි දිනයේ ප්‍රධාන කර්තව්‍යය වූ බැවින් වැඩිහිටි දිනයේදීම එම උපහාර පිදීමට හැකියාව තිබියදීත් එම දිනය අවසන්වී මාස 04 කට පමණ පසුව ත්‍යාග ලබාදී තිබුණි. එම මුදල් ලැබෙන අවස්ථාව වන විට වැඩිහිටියන් බොහෝදෙනෙකු මියගොස් තිබූ බව අනාවරණය විය. වැඩිහිටි සමාජයට ඉටුවිය යුතු එක් අරමුණක් ඉටුකිරීමට මෙවැනි ප්‍රමාදයක් පැවතීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව විගණනය පෙන්වාදෙනු ලැබේ.

**(ඉ) වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි සහ ස්ටිකර් අලෙවිය**

---

වැඩිහිටි දිනය වෙනුවෙන් කොඩි සතියක් ආරම්භ කර රු.979,558 ක් වැයකර කොඩි 2,310,000 ක් සහ ස්ටිකර් 33,100 ක් මුද්‍රණය කර තිබුණි. එම කොඩි සහ ස්ටිකර් බෙදාහැරීම සඳහා රු.115,615 ක් වැය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 කට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 317 කට කොඩි 2,302,400 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 කට ස්ටිකර් 28,200 ක් බෙදාදී තිබුණි. එක් කොඩියක් රු.10 ක් සහ ස්ටිකර් එකක් රු.100 ක් ලෙස මිළ කර තිබුණු අතර කොඩි හා ස්ටිකර් වල මුහුණත් වටිනාකම රු.26,410,000 ක් විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දිස්ත්‍රික්ක 25 කට ලබාදුන් කොඩි 2,302,400 කින් කොඩි 1,856,322 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 317 කට බෙදාදී තිබුණි. ඒ අනුව ඉතිරි කොඩි 446,078 ක් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) කොඩි සහ ස්ටිකර් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට 35 ක් හෙවත් රු.11,658,500 ක් ආයතනයට ලැබිය යුතු අතර ආයතනයට ලැබී තිබුණේ රු.826,194 කි. එසේම සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 230 ක කොඩි 1,653,460 ක් හෙවත් සියයට 71 ක ඉතිරියක් පැවති අතර අලෙවි නොකරන ලද කොඩි 75,422 ක් විනාශ කර තිබුණි. එසේ ඉතිරිවූ කොඩි සහ විනාශ කරන ලද කොඩි 1,728,882 ක මුද්‍රණ පිරිවැය රු.587,799 ක් වූ අතර එය ආයතනයට පාඩුවක් විය. මේ අනුව කොඩි මුද්‍රණය හා බෙදාහැරීම සහ කොඩි අලෙවිකිරීම හා අලෙවි ආදායම් රැස්කර ගැනීමට ආයතනය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක් සඳහා ස්ටිකර් 28,200 ක් බෙදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 13 කින් ස්ටිකර් 2,490 ක් අලෙවි වූ බව නිරීක්ෂණය විය.ඒ අනුව ස්ටිකර් 25,710 ක් අලෙවිකළ බවට තොරතුරු ඉදිරිපත් නොවූ අතර එම ස්ටිකර්වල මුද්‍රණ පිරිවැය රු.159,753 ක් විය.

**(ඊ) වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා ගැනීම**

---

2017 ජනවාරි මාසයේදී වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම ආරම්භ කර තිබුණු නමුත් එය අවසන් කර නොතිබුණි. එසේම වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 150 ක් හඳුනා ගෙන තිබුණද වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ආධාර මුදල් ලබාදී නොතිබුණි.

**(උ) වැඩිහිටි නිවාස සුපරීක්ෂණය**

---

ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන මුළු වැඩිහිටි නිවාස සංඛ්‍යාව 306 ක්වූ අතර කාර්යාලයේ ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව 119 ක් වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මෙම වැඩිහිටි නිවාස වලින් 19 ක් පමණක් කාර්යාලය විසින් පරීක්ෂාවට ලක්කර තිබුණි.

**(ඌ)පනතේ අරමුණු ඉටු නොකිරීම**

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාර වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව විසින් පහත සඳහන් කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම

(ii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාශ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම,

(iii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම

(iv) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නඟාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධිකරණය කිරීම

(v) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

(vi) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම සහ මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුලත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වයස අවුරුදු 75 දක්වාවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම සහ අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී ලැබුණු රු.5,000,000 කින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල 331 ක දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා එම වර්ෂයේදී රු.3,305,836 ක් වැය කර තිබුණි. ඉන් ඉතිරිය වූ රු. 1,694,164 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. කෙසේ වුවද විගණිත දිනය වූ 2018 ජූනි 30 දිනවන විට වර්ෂ 02 ක් ගතවී ඇතත් ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කර නොතිබුණි.

(ආ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම සඳහා 2009 වර්ෂයේදී තෑගි ඔප්පුවකින් ලැබුණු අක්කර 02 ක් වූ නිවිතිගල නිල්වලා සෙවන

ආබාධිත මධ්‍යස්ථානයේ ඉඩම සහ ගොඩනැගිල්ල ඇස්තමේන්තු කර පවරා ගැනීම සිදුකර ගෙන නොතිබුණි. එසේම එම වර්ෂයේදීම රු.390,000 ක අළුත්වැඩියාවක් ද එම ගොඩනැගිල්ලේ සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන වසා දමා තිබීමේ හේතුවෙන් අදාල පාර්ශවකරුවන්ද මෙම ඉඩම නැවත ඉල්ලා නඩු පවරා තිබුණි.

(ඇ) ආයතනය විසින් 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මිළදීගත් වටිනාකම රු.26,715,433 ක් වූ ලීබඩු, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ එක් එක් වර්ෂයේදී වත්කම් වර්ගීකරණය සිදුනොකර වර්ෂය තුළ මිළදීගත් මුළු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබීමෙන් අපහරණයන් සහ ප්‍රයෝජනයට නොගන්නා වත්කම් හඳුනා ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී කාර්යාලයේ සේවයෙන් විශ්‍රාම ගත් නිලධාරීන් 06 දෙනෙකු සඳහා පාරිතෝෂික රු.104,445 ක් වැඩියෙන් ගෙවා තිබුණු අතර වාර්තාවේ දින වනවිටත් එම මුදල් අයවී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා මාසිකව ලබා දෙන රු.2,000 ක වැඩිහිටි දීමනාවෙන් නැවත රු.100 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබා දෙන අතර එම මුදලින් කළයුතු කාර්යයන් 10 ක් සඳහා ඉකුත් වර්ෂයේ අගෝස්තු 30 දිනැති අංක අමප/16/0719/711/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතියද ලබාගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.860,094,400 ක මුදලක් ලැබී තිබුණු අතර අදාල කාර්යයන් ඉටුකිරීමකින් තොරව ලැබුණු මුදලින් රු.841,783,300 ක් රාජ්‍ය බැංකු 02 ක කෙටිකාලීන ස්ථාවර තැන්පතු ගිණුම්වල තැන්පත් කර තිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩිහිටි දීමනාවෙන් අය කරනු ලබන රු.100 ක මුදල චෙක්පත් මගින් එවන අතර එහිදී දෝෂ සහිත චෙක්පත් ආයතනය විසින් නැවත එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 54 කින් රු.19,738,200 ක් අයවිය යුතුව පැවතුණු අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් පියවරගෙන නොතිබුණි.

(ආ) ආයතනය විසින් ස්ථාවර තැන්පතු කල්පිරීමේදී ප්‍රති ආයෝජනය කරන අතර එසේ කල්පිරුණු රු.577,394,762 ක් වටිනාකමැති ස්ථාවර තැන්පතු ප්‍රති ආයෝජනය තෙක් දින 07 සිට දින 47 ක කාලයක් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් රු.2,675,830 ක පොළියක් අහිමිවී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයකු තම පෞද්ගලික විදේශ ගමනක් වෙනුවෙන් වැයකර තිබුණු රු.59,800 ක් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා ආයතනය වෙත 2011 වර්ෂයේදී බාහිර පාර්ශවයකගෙන් තෑගි ඔප්පුවක් මගින් වටිනාකම රු.13,000,000 ක් වූ ගම්පහ හෝලික්‍රොස් ඉඩම සහ රු.3,200,000 ක් වටිනාකමැති භාරගම රාජිත වත්ත ඉඩම ලැබී තිබුණද නිවාස ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට අපොහොසත් වීම හේතුවෙන් එම ඉඩම් නිෂ්කාර්යව පැවතිණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 143 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 133 ක් විය. ඒ අනුව පුරප්පාඩු 10 ක් පැවතිණි. 2011 වර්ෂයේ සිටම පුරප්පාඩුවී පැවති සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර 2018 මැයි 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරියකු බඳවා ගැනීමට 2017 ජනවාරි 11 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද විගණිත දිනය වූ 2018 මැයි 18 වනවිටත් ඒ සඳහා නිලධාරියකු බඳවාගෙන නොතිබුණි.

(ඇ) නුවරඑළිය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිසිවක් සඳහා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් පත්කර නොතිබුණු අතර රත්නපුර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර තිබුනේ අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවකි.

**5. තිරසර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත්වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 වන ඡේදය පරිදි කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කළ යුතුවූවත් එම වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය

---------------

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රාග්ධන උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට නොවැම්බර් දක්වා අවස්ථා 06 කදී භාණ්ඩාගාරයෙන් රු.8,875,947 ක් ලබාගෙන තිබුණි. ආයතනය විසින් වර්ෂය තුළදී රු.2,325,055 ක උපකරණ මිළදී ගෙන තිබුණු අතර පරිගණක 63 ක් මිළදී ගැනීමේ කටයුතු දෙසැම්බර් 31 දින දක්වා ප්‍රමාද වීම හේතුවෙන් රු.6,550,892 ක් හෙවත් සියයට 73 ක් උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආයතනයේ අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන අයුරින් සකස්වී නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 26 සිට සියයට 93 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් හා පරිත්‍යාග නිසිපරිදි ගිණුම් ගත නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩලය පරිපාලනය | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම සභාවේ අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වීම. |
| (ඇ) | අරමුදල් පාලනය | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල නිෂ්කාර්යව පවත්වා ගැනීම |
| (ඈ) | ඉඩම් සංවර්ධනය | පරිත්‍යාග වශයෙන් ලැබෙන ඉඩම් අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගැනීම |